අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/16/01/01-2023/2025
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2026.05. 26

චක්‍රලේඛ අංක : 19/2026

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්
සියලුම තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වන පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩ සටහන හා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩ සටහන**

මහින්දෝදය ශිෂ්‍යත්ව වැඩ සටහන සම්බන්ධ 2014.06.30 දිනැති 23/2014 චක්‍රලේඛය හා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩ සටහන සම්බන්ධ 2014.07.03 දිනැති 22/2014 චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලබන අතර, තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩ සටහන හා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩ සටහන සම්බන්ධව නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය මින් ඉදිරියට බලාත්මක වේ.

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල මත අ.පො.ස (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ මූල්‍යමය දුෂ්කරතා මග හැරවීම සඳහා සහ දරුවන්ට බාධාවකින් තොරව සිය අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යාම සහතික වනු පිණිස තාක්ෂණවේදය සහ සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන් මහින් තෝරා ගනු ලබන ශිෂ්‍යත්වධාරීන්ට අදාළ වසර 02ක කාලය තුළ වාරික 20 කින් සමන්විත ශිෂ්‍යාධාර මුදලක් ප්‍රදානය කෙරේ.

2. ශිෂ්‍යත්ව ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම්

2.1. තාක්ෂණවේදය ශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්

2.1.1. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි
2.1.2. අ.පො.ස(සාමාන්‍ය පෙළ) විභාගයෙන් සුදුසුකම් ලබා, අ.පො.ස(උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන **සිසු සිසුවියන්** විය යුතුය.
2.1.3. ඉල්ලුම් පත්‍ර කැඳවන වර්ෂයේ ජූලි මස 31 වන දිනට වයස අවුරුදු 16 ට නොඅඩු හා 18 ට නොවැඩි විය යුතුය.
2.1.4. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 360,000/- ක් හෝ ඊට අඩු විය යුතුයි. (සමෘද්ධි ආධාර දීමනා මෙම ආදායම් සීමාවට ගණන් නොගන්නා බව සැලකිය යුතුයි)

2.2. සුජාත දියණි ශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්

2.2.1. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි
2.2.2. අ.පො.ස(සාමාන්‍ය පෙළ) විභාගයෙන් සුදුසුකම් ලබා, අ.පො.ස(උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන **සිසුවියන්** විය යුතුය.
2.2.3. ඉල්ලුම් පත්‍ර කැඳවන වර්ෂයේ ජූලි මස 31 වන දිනට වයස අවුරුදු 16 ට නොඅඩු හා 18 ට නොවැඩි විය යුතුය.
2.2.4. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 360,000/- ක් හෝ ඊට අඩු විය යුතුයි. (සමෘද්ධි ආධාර දීමනා මෙම ආදායම් සීමාවට ගණන් නොගන්නා බව සැලකිය යුතුයි)

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

3. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීම.

3.1 තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩසටහන හා සුජාත දියණී ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වන පාසල්වල විදුහල්පතිවරුන් වෙත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් නියමිත කාල වකවානුව තුළ දී මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 01 අනුව අයදුම්පත් නිකුත් කළ යුතු ය (තාක්ෂණවේදය විෂය ධාරාවට සිසුන් ඇතුළත් කරගැනීමෙන් පසු සැප්තැම්බර් මස පළමු සතිය තුළ).

3.2 එසේ නිකුත් කරනු ලබන අයදුම්පත් අදාළ ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ඇති සිසුන් වෙත නිකුත් කිරීමෙන් අනතුරුව සිසුන් විසින් සම්පූර්ණ කර විදුහල්පතිගේ සහතිකය සහ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව පදිංචි ප්‍රදේශයේ ග්‍රාම සේවා නිළධාරී විසින් නිශ්චිත ආදායම් සීමාවට අයත් බවට ලබාදී ඇති ආදායම් සහතිකය ද සමඟ විදුහල්පති මඟින් අයදුම් කරන වර්ෂයේ සැප්තැම්බර් මස 30 දිනට පෙර තම පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතුය.

3.3 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තමන් වෙත ලැබෙන අයදුම්පත් සියල්ල ගොනු කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස 10 වන දිනට ප්‍රථම යොමු කිරීමට කටයුතු කළ යුතුය.

4. ශිෂ්‍යත්ව සඳහා තෝරා ගැනීම.

4.1 අ) අ.පො.ස (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමට සුදුසුකම් සපුරා, තාක්ෂණවේදය විෂය ධාරාව හදාරනු ලබන සිසුන් අතරින් පවුලේ වාර්ෂික ආදායම රුපියල් 360,000/- ක් හෝ ඊට අඩු පවුල්වලින් මුළු දිවයිනම නියෝජනය වන පරිදි සිසුන් තොරා ගනු ලැබේ.

4.2 අ) තාක්ෂණවේදය ශිෂ්‍යත්වය සඳහා සිසු සිසුවියන් 700 දෙනෙකු සහ සුජාත දියණී ශිෂ්‍යත්වය සඳහා සිසුවියන් 250 දෙනෙකු වශයෙන් ශිෂ්‍යත්වධාරීන් තෝරා ගනු ලැබේ.

ආ) එම ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව සමානුපාතිකව දිස්ත්‍රික්ක 25 සඳහා බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව එක් දිස්ත්‍රික්කයක් සඳහා තාක්ෂණවේදය ශිෂ්‍යත්වය වැඩ සටහන යටතේ සිසු සිසුවියන් 28 දෙනෙක් බැගින් හා සුජාත දියණී ශිෂ්‍යත්ව වැඩ සටහන යටතේ එක් දිස්ත්‍රික්කයකින් සිසුවියන් 10 දෙනෙක් බැගින් තෝරාගැනීමට කටයුතු කරනු ලැබේ.

ඇ) එහෙත් යම් පළාතකට අයත් දිස්ත්‍රික්කයට නියමිත ශිෂ්‍යාධාර සංඛ්‍යාවට අදාළ අයදුම්පත් ලැබී නොමැති හා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

- යම් පළාතකට අයත් දිස්ත්‍රික්කයකට ප්‍රමාණවත් අයදුම්පත් ලැබී නොමැති නම් එම පළාතට අයත් වෙනත් දිස්ත්‍රික්කයක වැඩි අයදුම්පත් ප්‍රමාණයක් ඇත්නම් හිඟ දිස්ත්‍රික්කයකට ලබාගත හැකිය.

ඇ) යම් ශිෂ්‍යයාවකට තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩසටහන හා සුජාත දියණී ශිෂ්‍යත්ව වැඩසටහන අතරින් එක් ශිෂ්‍යත්ව වැඩසටහනක් යටතේ පමණක් ශිෂ්‍යාධාර ලබා ගැනීමට හැකියාව පවතී.

4.3 අ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩසටහන හා සුජාත දියණී ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීම සඳහා නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත තේරීමේ කමිටුවක් පත් කළ යුතුය. එම කමිටුව මඟින් උපලේඛන 02 මඟින් දක්වා

ඇති නිර්ණායක සහ ලකුණු ලබාදීමේ පටිපාටිය යටතේ ලකුණු ලබා දී (මෙහිදී ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍යයාවන් 10 දෙනෙකු සුජාත දියණි ශිෂ්‍යත්වය සඳහා තෝරා ගැනීමෙන් අනතුරුව තාක්ෂණවේදය ශිෂ්‍යත්වය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යයාවන් තෝරා ගත යුතුය.) එම ලකුණු අනුපිළිවෙල අනුව දිස්ත්‍රික් මට්ටමින් සුදුසුකම් ලබන ශිෂ්‍ය නාමලේඛනය උපලේඛන අංක 03 හි දැක්වෙන ආකෘතිය අනුව සකස් කළ යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරන ලද නාමලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) වෙත එවිය යුතු ය.

## 05. ශිෂ්‍යත්ව ප්‍රදානය

5.1 ශිෂ්‍යාධාර එක් සිසුවෙකු සඳහා මසකට රුපියල් 750/- බැගින් අ.පො.ස(උසස් පෙළ) පන්තියේ ඉගෙනුම ලබන මාස 20ක කාලයක් සඳහා ලබා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යාධාර මුදල සිසුන් ඉගෙනුම ලබන පාසල පිහිටි ප්‍රදේශයට ආසන්නව පිහිටි මහජන/ලංකා බැංකු ශාඛාවක ශිෂ්‍යත්වලාභියාගේ නමට විවෘත කරනු ලබන බැංකු ගිණුමට එකවර බැර කරනු ලැබේ. එම ගිණුම් අංකය හා ශාඛා කාර්යාලය පිළිබඳ විස්තර පාසලේ විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

5.2 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ බැංකු ගිණුම් විස්තර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

5.3 ඉහත 4.3 පරිදි තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවූ පසු ශිෂ්‍යාධාර ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එළඹෙන වර්ෂයේ දී අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත නිකුත් කරනු ලබන අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් එම ශිෂ්‍යාධාර අදාළ සිසුන්ගේ බැංකු ගිණුම් වෙත ගෙවිය යුතු ය.

## 06. ශිෂ්‍යත්වය අහෝසි වීම

6.1 පහත සඳහන් අවස්ථා පිළිබඳ සලකා බලා සිසුන්ට ලබා දෙන ශිෂ්‍යත්ව අහෝසි කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

- ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීම නිසා දඬුවම් ලැබීම.
- අඛණ්ඩව පාසලට නොපැමිණීම.
- අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
- අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.

මහත්මා ගාන්ධි, ඩයලොග් ශිෂ්‍යත්ව යටතේ ශිෂ්‍යාධාර ලබන සිසු සිසුවියන් සිටී නම් තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩසටහන හා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යාධාරය සඳහා හිමිකමක් නොමැත.

නාලක කළුවැව
ලේකම්

## තාක්ෂණවේදය විෂය ධාරාව හදාරනු ලබන අඩු ආදායම්ලාභී සිසු සිසුවියන් සඳහා ප්‍රදානය කරනු ලබන තාක්ෂණවේදය සහ සුජාත දියණි ශිෂ්‍යත්ව ඉල්ලුම් පත්‍රය

අධ්‍යයන වර්ෂය :- ..............................

1. සිසුවා/සිසුවියගේ සම්පූර්ණ නම:-

2. 2.1 පෞද්ගලික ලිපිනය:-

   2.2 දුරකථන අංක:- ස්ථාවර: ජංගම:

3. උපන් දිනය:-

4. ස්ත්‍රී / පුරුෂ භාවය:-

5. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ තොරතුරු:-

   5.1 ප්‍රථම වතාවට අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය:-
   (අදාළ අධ්‍යයන වර්ෂය ඉදිරියේ √ ලකුණ යොදන්න)
   2024 ☐ 2025 ☐

   5.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල (පහත වගුවේ සඳහන් කරන්න.)

   වර්ෂය - විභාග අංකය - විභාගයට පෙනී සිටි පාසල-

| අනු අංකය | විෂයය | ලබා ගත් සාමාර්ථය | |
|---|---|---|---|
| | | ජාතික මට්ටම ඇගයීම | පාසල් පාදක ඇගයීම |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |
| 9 | | | |

6. අ.පො.ස.(උසස් පෙළ) පිළිබඳ තොරතුරු:-

   6.1 අ.පො.ස.(උසස් පෙළ) ඉගෙනුම ලබන පාසල :-

   6.2 එම පාසල අයත් පළාත සහ දිස්ත්‍රික්කය :-

   6.3 අ.පො.ස.(උසස් පෙළ)හදාරනු ලබන විෂය ධාරාව :-

   6.4 අ.පො.ස.(උසස් පෙළ)දැනට ඉගෙනුම ලබන ශ්‍රේණිය:-
   (12 ශ්‍රේණිය හෝ 13 ශ්‍රේණිය ද යන වග)

   6.5 ඉහත 6.3 යටතේ හදාරනු ලබන විෂයයන් :-
   1.
   2.
   3.

කරු.අ.පි.බ.

7.පවුලේ තොරතුරු:-

7.1 පියා/නීත්‍යානුකූල භාරකරුගේ නම:-

රැකියාව :-

7.2 මවගේ නම :-

රැකියාව :-

8. දෙමාපියන්ගේ වාර්ෂික ආදායම :-

9.සිසුවා/සිසුවිය දැනට වෙනත් ශිෂ්‍යාධාරයක් ලබන්නේ නම් ඒ පිළිබඳ තොරතුරු:-

...................................................................................................................................................

...

10. ශිෂ්‍යයා/ශිෂ්‍යාවට ලංකා බැංකු/මහජන බැංකු ගිණුමක් (වැඩිහිටි/ක්‍රියාකාරී) තිබේ නම් හෝ නැති නම් නව ගිණුමක් විවෘත කර එම ගිණුමේ,

ගිණුම් අංකය:..................................................... බැංකු ශාඛාවේ නම හා
අංකය:...................................

(විදුහල්පති විසින් සහතික කරන ලද, පාස් පොතෙහි මුල් පිටුවේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා මා තෝරා ගතහොත් එම ශිෂ්‍යත්වයට අදාළ නීති රීති හා ව්‍යවස්ථා ආදියට එකඟ වන බවත් ප්‍රකාශ කර සිටිමි.

..................................................... .....................................................

දිනය සිසුවා/සිසුවියගේ අත්සන

**අ.පො.ස.(උසස් පෙළ) හදාරනු ලබන විදුහලේ විදුහල්පතිගේ නිර්දේශය:**

........................................................................................සිසුවා/සිසුවිය .....................ශ්‍රේණියේ සිට මෙම පාසලේ ඉගෙනුම ලබන බවත්, අ.පො.ස.(උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීම සඳහා .............................................................විද්‍යාලයෙන් මෙම පාසලට පැමිණි බවත්, ඔහු/ඇය යහපත් හැසිරීමකින් යුත් ඉගෙනුම් කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන අයෙක් බැවින් ඉහත ශිෂ්‍යත්වය සඳහා නිර්දේශ කරමි.

..................................................... .....................................................

දිනය විදුහල්පතිගේ නම හා අත්සන

පාසලේ දුරකථන අංකය:-

**ග්‍රාම නිලධාරීගේ සහතිකය**

...................................විද්‍යාලයේ විදුහල්පති විසින් ඉදිරිපත් කරන ලද ඉහත නම් සහ ලිපිනයන් සඳහන් ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ ................................. දිනට මව/පියා/භාරකරුගේ වාර්ෂික ආදායම පරීක්ෂා කොට ඉහත අනු අංක 8 අනුව අඩු ආදායම්ලාභී ගණයට අයත් වන බවට සහතික කරමි.

ග්‍රාම නිලධාරීගේ නම : අත්සන :

නිල මුද්‍රාව :

දිනය :

## තාක්ෂණවේදය සහ සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන - ..................

### තෝරා ගැනීමේ නිර්ණායක

01. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි
02. අ.පො.ස(සාමාන්‍ය පෙළ) විභාගයෙන් සුදුසුකම් ලබා, අ.පො.ස(උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන **සිසු සිසුවියන්** විය යුතුය.

(**සැ.යු.** - සුජාත දියණි ශිෂ්‍යත්වය සඳහා සිසුවියන් පමණක් සලකා බැලිය යුතුය.)

03. ඉල්ලුම් පත්‍ර කැඳවන වර්ෂයේ ජූලි මස 31 වන දිනට වයස අවුරුදු 16 ට නොඅඩු හා 18ට නොවැඩි විය යුතුය.
04. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 360,000/- ක් හෝ ඊට අඩු විය යුතුයි. (සමෘද්ධි ආධාර දීමනා මෙම ආදායම් සීමාවට ගණන් නොගන්නා බව සැලකිය යුතුයි)

**තාක්ෂණවේදය ශිෂ්‍යත්වය**

*දිස්ත්‍රික්කයකින් සිසු සිසුවියන් 28 දෙනෙකු බැගින් තෝරා ගැනේ.

**සුජාත දියණි ශිෂ්‍යත්වය**

*දිස්ත්‍රික්කයකින් සිසුවියන් 10 දෙනෙකු බැගින් තෝරා ගැනේ.

### ලකුණු ලබාදීමේ ක්‍රියාපටිපාටිය

| සාමාර්ථය | | ලබාදෙන ලකුණු |
|---|---|---|
| අධි සාමාර්ථය | (A) | 10 |
| විශිෂ්ට සාමාර්ථය | (B) | 08 |
| සම්මාන සාමාර්ථය | (C) | 06 |
| සාමාන්‍ය සාමාර්ථය | (S) | 04 |

(උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 90කි.)

උපලේඛනය 03

**ශිෂ්‍යත්වය - තාක්ෂණවේදය/ සුජාත දියණි**

(අනවශ්‍ය වචනය කපා හරින්න.)

**සුදුසුකම් ලබන ශිෂ්‍ය නාම ලේඛනය**

පළාත -.................................        දිස්ත්‍රික්කය - ....................

| අනු අංකය | නම | පාසල | දුරකතන අංකය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |